දිවි තොර කරගැනීම් සම්බන්ධ පුවත් හෝ ලිපි පළ කිරීමේදී, එය දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමට උත්ප්‍රේරකයක් බවට පත් නොකිරීමට මාධ්‍යවේදීන් අත සමාජ වගකීමක් තිබේ. දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය, සමාරිටන්ස් වැනි අදාළ සංවිධාන හඳුන්වා දී ඇති ආචාර ධර්ම හා මාර්ගෝපදේශනයන් පිළිපැදීම අත්‍යවශ්‍ය වන්නේ ද ඒ අදහසිනි.

කෙසේ නමුත් කණගාටුවට කරුණ වන්නේ, තවමත් මෙම වගකීම බරපතල ලෙසින් සලකන්නට ඇතැම් මාධ්‍යවේදීන් සූදානම් නොවීමයි.

පේරාදෙණිය සරසවියේ සිසුවෙකු මිය ගිය පුවත පදනම් කරගනිමින්, මනෝවෛද්‍ය විශේෂඥ රූමි රූබන්ගේ අදහස් ද එක් කරගනිමින් ධරණී පුවත්පතෙහි (ඔක්. 05, 2022) පළව තිබූ ලිපිය ඊට නිදසුන් ලෙස ගත හැක.

මෙහි දිවි තොර කරගත් අය ඊට පෙර ලියා තැබූ ලිපියේ කොටස් පළ කොට ඇත. එසේම, හදිසි උපකාරක අංක ද සඳහන් කර නොමැත.

ඒ අනුව, මෙම ලිපිය ඉහත කියූ වගකීම බැරෑරුම්ව ගනිමින් පළ වී ඇතැයි ඔබ සිතන්නේ ද?

උපකාරක අංකයක් සඳහන් කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:
* CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
* ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

https://media.samaritans.org/.../Guidance_for_reporting...